

# මිනි මස් කා ඇන්දිස් කඳුවැටියේ දිවි රැක ගත්තෝ

**දිලීප සංජය රණවක**

ඇන්දිස් කඳු වැටිය යන වචනයට වඩා මහ ඇන්දිස් කඳුවැටිය ලෙසින් හැඳින්වීම නිවරැදිය මන්ද අදටත් හඳුනා නොගත් නම් නොකරන ලද අහස පරයා නැගෙන දැවැන්ත කඳු ඇන්දිස් කඳුවැටියට අයත් බැවිනි. අභ්‍යාවකාශයේ සිට බලන කළද මහ ඇන්දිස් කඳුවැටිය දකුණු ඇමෙරිකාවේ චිලි සහ ආජන්ටිනාවේ දේශසීමා අසල නිදා සිටින විශාල යෝධයෙකුගේ කොඳු නාරටියක් මෙන් පෙනෙයි..

සැහැල්ලු ගුවන් නියමුවන් පවා ඇන්දිස් කඳුවැටිය උඩින් පියාසර කරන්නට සිතන්නේ නැත.. මන්ද දැඩි මීදුම් ස්භාවයක් හා නිතර වලාකුළු වලින් වැසී ඇති ඇන්දිස් කඳුවැටියේ උස් වූ කඳු මුදුන් ඒවා අතරින් දැක ගැනීම අපහසු වන බැවිනි. එම නිසාම බොහො ගුවන් නියමුවන් කඳුවැටිය දිගේ ඉදිරියට ගොස් හරවා අනිත් පැත්තට යාමට පෙළඹෙන්නේ ජීවිතයට ඇති ආශාව නිසාමයි. මේ කතාවෙන් කියවැන්නේ ලෝක ඉතිහාසයේ වාර්තා වූ විශිෂ්ඨතම දිවි ගලවා ගැනීමේ කතා පුවත ගැනයි. ඒ කිසිවෙකුත් නැති ඇන්දිස් කඳුවැටියේ හඳුනා නොගත් ප්‍රදේශයකට වැටුනු ගුවන් යානයක සිටි පිරිසකි. මෙතන් පටන් ඔවුන්ගේ කතාවයි.

වර්ෂ 1972 ඔක්තොම්බර් 13 වෙනිදා turbo-prop Fairchild FH)227D වර්ගයේ ගුවන් යානයක් වුනු Uruguayan Air Force Flight 571 ගුවන් යානය ඇන්දිස් කඳුවැටියට තරමක් ඈත අහසේ පියාසර කරමින් තිබුණි. ගුවන් යානයේ ගමන් කළ පිරිස අතර Old Christians Club rugby union කණ්ඩායම උරුගුවේ මොන්ට්විඩියෝ සිට චිලි වල සැන්ටියාගෝ දක්වා ගමන් කරමින් සිටියේය. ගුවන් යානයේ සිටි සියලූ මගින් ප්‍රමාණය හා කාර්ය මණ්ඩලය වුයේ 45කි. නමුත් පැවැති දැඩි කාලගුණ තත්ත්වයක් නිසා යානය ආජන්ටිනාවේ මෙන්ඩෝසා වල නවත්වන ලද්දේ පසුදා ගුවන් ගතවීමේ අපේක්ෂාව ඇතිවය. පසුදා ගමන ආරම්භ කරන ලද්දේ ගුවන් නියමුවන්ගේ අමුතු තීරණයක් සමගයි. ඒ මහ ඇන්දිස් බාධකය හරහා තමන්ගේ ගුවන් යානය ගෙන යාමයි. නමුත් ගුවන් යානය ඒ සදහා කිසිම විටක සුදුසු නොවිය, ගුවන් නියමුවන් යානය මීටර් 9000 (අඩි (30,000) සීමාව දක්වා ඉහළ එසවීය. ගුවන් නියමුවන් මේ තීරණය ගත්තේ දැඩි කාලගුණ ස්භාවය නිසාය ඔවුන් අපේක්ෂා කළේ කඳුවැටියට ඉහළින් ගුවන් යානය කාලගුණය පසු කර යාමටයි..

ගුවන් යානය මීදුම අතරින් ගමන් කරමින් තිබුණි. එක්වරම මීදුම අතරින් දුටු දෙය දැක ගුවන් යානා නියමුවන් ට කර ගත හැකි දෙයක් නොවිය. ඒ දැවැන්ත ඇන්දිස් කඳුවැටියේ හඳුනා නොගත් නම් නොකරන ලද කඳු මුදුනකි. ගත වුනේ තත්ත්පර කිහිපයකි. වේගයෙන් පැමිණි ගුවන් යානය කඳු මුදුනේ වැදී විසි වී ගියේය. ගුවන් යානයේ පියාපත් කැඩී විසි වී ගියේය.. පියාපත කැඩුනු ගුවන් යානය නිරුපද්‍රිතව ඉතාමත් වේගයෙන් මීටර් 4200ක් තරම් ප්‍රපාතයකට වේගයෙන් හිම මත ලිස්සාගෙන ගියේය.. පහළට වේගයෙන් ගිය ගුවන් යානය තවත් කඳු ගැටයක වැදී ඉතිරි පියාපතත් කැඩී ගියේය. යානයේ වේගයේ අඩුවක් නොවිය. ඉතා වේගයෙන් ඇදී ගිය ගුවන් යානය හිම මත ගැටී නැවති ගියේය. පැවැතියේ දැඩි නිහඬ තාවයකි. මොහොතකින් සියල්ල නිමා විය. ගුවන් යානය තුළින් වේදනාවෙන් කෑ ගසන හඬවල් ඇසෙන්නට විය. බොහො දෙනෙක් තුවාල ලබා සිටි අතර තවත් කිහිප දෙනෙකුගේ ජීවිත අහිමිව තිබුණි. ගුවන් යානයේ සිටි 45 දෙනාගෙන් 12 දෙනෙකුම ඒ වෙන විටත් ජීවිතක්ෂයට පත් වී තිබුණි.




පසුදා උදෑසන දැඩි තුවාල ලබා සිටි තවත් 5 දෙනෙකු මිය ගියේය. ඉතිරිව සිටියේ 27 දෙනෙකු පමණයි. ඒ අතරින් එක් අයෙකු වුනු Nando parrado කෝමා තත්ත්වයෙන් සිටියේ ඔහුගේ හිසට වැදුනු පහරක් නිසායි. ඉතිරිව සිටි 27 දෙනා දැඩි අර්බුදයකට මුහුණ දීමට පටන් ගත්තේ කෑම හා බීම සහ රුධිරය කැට ගැසී යාමට තරම් දැඩි සීතල ස්භාවය නිසායි. ඔවුන් ඉතිරිව තිබුනේ කුඩා චොක්ලට් ප්‍රමාණයක් හා වයින් බෝතල් කිහිපයක් පමණයි. කෝමා තත්ත්වයේ පසු වූ නන්දෝ පැරාඩෝ සිහිය ලබමින් සිටියේය. ඔහු අවදි වූ විගසම ඇසුවේ තමන්ගේ මව සහ නැගණිය ගැනයි මන්ද ඒදා ගුවන් යානයේ පිරිස අතර ඔවුන්ද සිටියේය. මිය ගිය අය අතර නන්දෝ පැරාඩෝගේ මවද සිටියේය.. දැඩි තුවාල ලබා සිටි ඔහුගේ නැගණියද මිය යමින් සිටියේය. නන්දෝ හට තමන්ගේ මව වෙනුවෙන් කළ හැකි දෙයක් නොවුනු නිසා ඔහු ඇයගේ නැගණිය අසලට වී සිටියේය. පසුදා උදෑසන නන්දෝ දෙස අවසන් වරට බැලු ඔහුගේ නැගනිය ඔහුගේ දෑත් මතම අවසන් හුස්ම හෙළිය. සියලූ දෙනා නිහඬව සිටියේය..

දින 5ක් පමණ ගෙවී ගිය පසු අහසේ ගුවන් යානය හඬක් ඇසෙන්නට පටන් ගත්තේ සියලූ දෙනාගේ ජීවත් වීමේ ආශාව වැඩි කරමිනි. ඔවුන් සියලූ දෙනා එළියට බැස කෑ ගැසීමට පටන් ගත්තාත් ගුවන් යානයේ වෙනසක් නොවීය. පසුව ගුවන් නියමුවන් සිදු කළ ප්‍රකාශ වල තිබුනේ පහළ සියලූ දේ හිම වලින් වැසී ඇති නිසා කිසිවක් සොයා ගත නොහැකි වූ බවයි. දින 5කට ආසන්න කාලයක් නැති වූ ගුවන් යානය සෙවීමේ කටයුතු සිදු කරත් නන්දෝ ඇතුළු පිරිස සිටි තැන සොයා ගැනිමට කිසිදු ගලවා ගැනීමේ කණ්ඩායමකට නොහැකි විය. සතියක් පමණ ගත වෙන විට ඔවුන්ට අවසානයේ ඉතිරි වුයේ ගුවන් යානයේ තහඩු මත හිම තමා දිය කර ගත් ජලය පමණයි.. ඔවුන් සතු චොකලට් හා ස්නැක් බාර් අවසන් වී තිබුණි.

කෑම සියල්ලම අවසාන වූ පසු බොහො දෙනා ගුවන් යානයේ අසුන් වල තිබු ලෙදර් හා පුළුන් ආහාරයට පටන් ගත්තේ ය. එයින් බොහො දෙනා දැඩි ලෙස රෝගාතුර වෙන්නට පටන් ගත්තේ ඒවා කෑමට සුදුසු දේවල් නොවන නිසායි. ආහාර සියල්ල අහිමි වූ පසුව ජලය පමණක් ඉතිරි විය. සීතලේ ආහාර නොමැතිව ජීවත් විමටද නොහැකිය. නන්දෝගේ සිතේ දැඩි තිරණයක් හට ගෙන තිබුණි. ඒ මිය ගිය අයගේ මාංශ අනුභව කිරීමයි. නන්දෝ තමන්ගේ තීරණය ඔහුගේ මිතුරෙකුට පැවසීය. කිසිවෙකුගේ විරුද්ධත්වයක් නොවීය ඒ නන්දෝට පෙර අනිත් පිරිසගේ ද සිත් තුළ ඒ අදහස ගැබ්වී තිබුණි නිසාවෙනි. ගුවන් යානයේ ජනෙල් වල තිබුනේ ප්ලාස්ටික් ජෙන්ලය. එයින් කොටස් කඩා ගත් ඔවුන් මිය ගිය අයගේ සිරුරු කපා ගැනීමට භාවිතා කලේය. ඔවුන්ගේ මුල්ම ආහාරය වුයේ මිය ගිය ගුවන් නියමුවෙකි. ඔහුගේ හම කැපු ඔවුන් අභ්‍යන්තර අවයව හා සීතලට කැටි ගැසී තිබුනු මේද තට්ටු ප්ලාස්ටික් කැබැලි වලින් කපා හුරාගෙන කෑමට පටන් ගත්තේ ය. ආහාර ඔවුන්ට අවශ්‍යම දෙයක් විය. ඒවා නැතිව ඔවුන්ට ජීවත් විමට නොහැකි විය. ආහාර අර්බුදය එලෙස නිමාවිය.

ගුවන් යානයේ තෙල් ටැංකියේ තිබු තෙල් බාවිතා කර ගිනි මැලයක් ගසා ඔවුන් 27 දෙනා උණුසුමට වී සිටියේය.. ගුවන් යානය තුල ඉඩ තබා ගැනීමට අවශ්‍ය බැවින් මිය ගිය සියලූ දෙනාගේ සිරුරු එළියට ඇද දමන ලදි. සියලූ දෙනාගේ බේරී යාමේ ආශාව නැති වී තිබුනු ඔවුන් සියලූ දෙනා



හුස්ම අවසන් වෙන තුරු එය තුලට වී බලාපොරොත්තු අහිමිව සිටියේය. ඉතිරිව තිබුනේ හිම දිය කර සදා ගත් ජලය සහ මිය අයගේ ශරීර වලින් ලබා ගත් මාංශ පමණයි. මේ අතර ගුවන් යානයේ සියලූ දෙනා අතර බයක් හට ගැනිමට පටන් ගත්තේ ය. ඒ කඳුවැටිය පුරාම ඇති විශාල ගැල්සියර තට්ටුව ගැනයි. එය කඩා වැටුනොත් තමන්ටද මේ සිටි තැනක් නොදන්නා ස්ථානයේ හිම මතම වැලලී යාමට සිදු වෙතැයි යන බිය.. දිනක් රාත්‍රීයේ පොලොවේ ඇති හිම වල දැඩි සෙලවීමක් දැනෙන්නට විය. සියලූ දෙනා සිටියේ දැඩි නින්දකය. එක්වරම පැමිණි දිය වී ගිය හිම තට්ටු ගුවන් යානයත් අවට සියලූ දෙත් වසාගෙන ගියේය. විශාල හිම තට්ටුවකින් 27 දෙනා සමගම ගුවන් යානය හිමට යට වී